
සමනල
සිරිපා

කතෘ ප්‍රකාශයකි.

ප්‍රථම මුද්‍රණය - 2023 දෙසැම්බර්

සෝදුපත් සැකසීම - ගයානී ජයසුන්දර

පරිගණක පිටු සැකසීම - ප්‍රසාද් ටෙක්නොලොජී

චිත්‍ර - W. G. N. R. බණ්ඩාර වීරසුන්දර

I S B N 978-824-208-083-3

# පිදුම

හෙට ලොව දිනන්නට

වෙර දරණ පුංචි

මල් කැකුළු වන්

දැයේ දූ පුතුන්ට

සෙනෙහසින් පුද දෙමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි  පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට්  දරුවනට ගැළපෙන "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක් වූ  පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය  මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

# සමනල සිරිපා

සීතල සුළඟට සෙලවුණු පුංචි රෝස මල් දෙකක් හිනාවෙලා බලාගෙන හිටියා.

"අනේ.......... හරිම ලස්සන ගවුම් පොඩිත්තක්" කාටද මේක? සමනල් තාත්තා අම්මගෙන් ඇහුවා.

මේක ඉතිං අපේ අලුතින් ඉපදෙන චුටි පැටියාටනේ සමනල් අම්මා සතුටින් උත්තර දුන්නා.

කාලය ගෙවිලා ගියා දවසක් හිමිදිරි පාන්දර සමනල් අම්මට ලස්සන ම ලස්සන සමනල් පැටියෙක් ඉපදිලා. තාත්තටයි අම්මටයි වගේම රෝස මල් කැකුළියන්ටත් හරිම සතුටුයි.

හැමෝම එකතුවෙලා අම්මා මහපු ලස්සන ගවුම් අන්දලා හැඩ බැලුවා.

සමනල් බබා දවසින් දවස ලොකු වුණා. නිල්,රතු, කහ, කොළ, ලස්සන පාටවලින් හැඩ වෙලා.

අපේ පැටියා දැන් ලොකු වෙලා හින්දා අපි සිරිපා වඳින්න යමුද කියලා අම්මා තාත්තාගෙන් ඇහුවා.

අනේ, ඔව් අපි පැටියාවත් අරන් ඉක්මනට යමු කියලා තාත්තා කිව්වා.

රෝස, පිච්ච, ඩේලියා, කපුරු, ගස් මල්වලින් බරවුණු එක ලස්සන දවසක් උදාවුණා.

තාත්තයි අම්මයි දෙන්නම ලස්සන කූඩයකට මල් කඩන්න ලෑස්ති වුණා. අනේ මාවත් අරන් යන්නකෝ කියලා රෝස කුමාරියෝ හයියෙන් කෑ ගැහුවා.

පාට පාට මල්වලින් පිරුණු ලස්සනම ලස්සන මල් කූඩ අරගෙන අම්මයි තාත්තයි ගෙට ආවා.

ආනේ සමනල් පැටික්කි තනියම ඇඳගෙන, පාට පාට රැළි දාලා මහපු ගවුම් පොඩිත්තට සමනල් පැටික්කි හරිම හැඩයි.

ඔන්න ඉතිං තුන්දෙනාම මල් කූඩ ටිකත් අරගෙන සිරිපා වඳින්න යන්න පිටත් වුණා. සමනල් පැටික්කි කවදාවත් එළියේ ලස්සන දැකලා තිබුණෝ නෑ.



අම්මේ, අර බලන්න වතුර පාරක්, අර බලන්න ලස්සන කන්දක් පැටික්කි තොරතෝංචියක් නැතුවම කියවනවා.

අම්මට උත්තර දීලා ඉවරයක් නෑ.

ඔන්න ඉතිං දැන් සමනල කන්ද පේනවා.

"පැටියෝ අර පේන්නේ සමනල කන්ද" තාත්තා අත දිගු කරමින් පෙන්නුවා.

සමනල පැටික්කි කවුරුහරි කියලා දීලා වගේ එක පාරටම සාදු සාදු කිව්වා. අම්මටයි තාත්තටයි හරි පුදුමයි.

මොකද ඉතිං හැමදාම අම්මා රෑට නිදියන කොට පැටියට කතන්දර කියලා දෙනවානේ ඒක නිසා පැටියා හරිම දක්ෂයි.

ඉර එළිය කඳු මුදුනින් ගලාගෙන එනවා. හරියට කන්ද මුදුනෙන් සුදු පාටින් වියනක් හදලා වාගේ.

හිරු කුමරා හැමෝටම ආයුබෝවන් කියනවා වගේ හිනා වුණා.

දැන් කන්ද දිහාට හැමෝම පියාඹනවා. කන්ද දෙපැත්ත පාට පාට මල්වලින් පිරිලා.

"අම්මේ අන්න සුරංගනාවියෝ" සමනල් පැටික්කි හයියෙන් කෑගැහුවා.

සුරංගනාවියන්ගේ අත් මල් කූඩ වලින් පිරිලා. මුළු පළාතම හරි ම සුවඳයි.



චුටි පැටියාට පියාඹන්න අමාරු නිසා සුරංගනාවියෝ අතින් අල්ල ගෙන ගියා.

ටික දුරක් ඔහොම යද්දි එක පාරට ම සීතල සුළඟක් හමාගෙන ආවා. අහස කළුපාට වලාකුළුවලින් බර වුණා. අනේ වැස්සක් එන්න එන්නේ.

අනේ දෙවියනේ.......! අපේ පැටියා, අම්මයි තාත්තයි හයියෙන් අඬන්න ගත්තා.

ඒත් එක්කම ආපු සුළං පාරට පුංචි පැටියා කන්දෙන් පහළටම ඇදගෙන වැටුණා.



අම්මයි තාත්තයි මහ හයියෙන් විලාප තියලා අඬ අඬා කන්ද පහළට පියඹුවා.

පුංචි පැටියා කන්ද පාමුල ඇස් දෙක පියාගෙන අම්මයි තාත්තයි පැටියා බදාගෙන අඬනවා.

පුංචි පැටියාගේ මුණ කඳුළුවලින් වැහිලා. පැටියා ඇස්දෙක අරින් නෑ.

අම්මයි තාත්තයි සමනල කන්ද දිහා බලාගෙන ප්‍රාර්ථනාවක් කළා.

අනේ බුදු සාදු! අපි ආවේ ඔයාව වඳින්න. අපි කාටවත් කරදරයක් කරලා නෑ අපේ පැටියව බේරලා දෙන්න කියලා අම්මයි තාත්තයි ප්‍රාර්ථනා කළා.

ඒත් එක්කම මහා පුදුම දෙයක් වුණා. පුංචි පැටියා ඇස් පිල්ලම් ගහන්න පටන් ගත්තා.

අම්මයි තාත්තයි පැටියව තුරුළු කර ගත්තා. සතුට වැඩිකමට දෙන්නට ඇඬුණා

අපි කාටවත් කරදරයක් කරලා නෑනේ. ඒ හින්දා අපිට කවදාවත් කරදරයක් වෙන්නේ නෑ කියලා හැමෝම සතුටින් සිරිපා වැන්ඳා.

ඊට පස්සේ හැම අවුරුද්දේම මේ සමනල පවුල සතුටින් සිරිපා වඳින්න ගියා.



# ස්තූතිය

මෙම පොත් පිංච එළිදැක්වීමට

නන් අයුරින් උදවු කළ මගේම

දයාබර යෙහෙළිය චාමිනි පල්ලියගුරු සහ

සමන්මලී ගුරුතුමියන්ලාට හදපිරි ස්තූතිය පුද කරමි.

A. R. මංජුලා සුමණසිංහ

(Dip.N.C.O.E.)

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023-10-20